122731
I
05/10

3001

# බුදුන්වහන්සේගේ දේශනා ක්‍රම ආශ්‍රිත

# ජනසන්නිවේදන විධි

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ

පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයට

ඉදිරිපත් කළ

පර්යේෂණ නිබන්ධනය

ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය (බුද්ධ ධර්මය)

දෙවන කොටස සඳහාය

ඇස්. දයා සිරිවර්ධන විසිනි

1981 ජනවාරි

122731

## බුදුන් වහන්සේගේ දේශනා ක්‍රම ආශ්‍රිත
## ජනසන්නිවේදන විධි

පටුන


හැඳින්වීම

බුදුසමය හා ජනසන්නිවේදනය

1 වැනි පරිච්ඡේදය

ඉගැන්වීම පිළිබඳ බෞද්ධ සංකල්පය

2 වැනි පරිච්ඡේදය

බෞද්ධ ඉගැන්වීමේ ක්‍රම විද්‍යාව

3 වැනි පරිච්ඡේදය

1. බුදුන් වහන්සේ
2. ධර්මයේ ස්වරූපය
3. මූලික දේශනාව
4. දේශනා කළ ක්‍රම
5. ප්‍රතිග්‍රාහකයා
6. දේශනාවේ ප්‍රතිඵලය

4 වැනි පරිච්ඡේදය

ධර්ම දේශනා ක්‍රම ආශ්‍රිත ජනසන්නිවේදන විධි

5 වැනි පරිච්ඡේදය

ශ්‍රාවක ප්‍රතිචාරය හා පෙළඹවීම් න්‍යාය

6 වැනි පරිච්ඡේදය

බුදුන් වහන්සේ ජනසන්නිවේදකයාන තෙනකුන් වශයෙන්

7 වැනි පරිච්ඡේදය

නිගමනය

## හැඳින්වීම

## බුදුසමය හා ජන සන්නිවේදනය

" බොහෝ අය බුදුසමය ආගමක් වශයෙන් දැනගෙන එහි ධර්ම කොට්ඨාශ විද්‍යාවන්ගේ ආකෘතිය, ක්‍රමය හා පර්යේෂණ වලින් වෙනස් කොට දැක්වීමට පෙළඹෙති. එහෙත් මූලික බුදුසමය කැමති කැමති පුද්ගලයා විසින් තමන්ම ප්‍රත්‍යක්ෂ කරගත යුතු විද්‍යානුකූල සිද්ධාන්තයක් සේ දැක්විය හැක. "[1]

මහාචාර්ය ගුණපාල මලලසේකර හා ආචාර්ය කේ.එන්.ජයතිලක " බුද්ධාගම හා ජාති ප්‍රශ්නය " නම් වූ පර්යේෂණාත්මක නිබන්ධනයෙහි මේ අදහස ඉදිරිපත් කරති.

බුදුසමයේ ඉතිහාසය අවුරුදු දෙදහස් පන්සිය ගණනකටත් අධිකතර කාලයකට දිවයයි. නූතන විද්‍යාවන්ගේ ආකෘතීන්, ලක්ෂණ සිද්ධාන්ත එහි විද්‍යමානය. මේ නිසා බුදුදහමත්, විද්‍යාවත් අතර සාදෘශ්‍යතා වේදැයි විමර්ශනය කර බැලීම විද්වතුන්ට අභිමතවූවක් බව යථෝක්ත පාඨයෙන් පැහැදිලි ය.

විද්‍යාව නිරන්තරයෙන් වෙනස් වන්නකි. නිතර පරීක්ෂණයට හා නිරීක්ෂණයට භාජනවේ. එහෙත් බුදුසමය යථාභූත ඥාන දර්ශනයකි. ඉද පච්චයතා ධර්මතාවක් උගන්වන ධර්මයකි.

බුදුන් වහන්සේගේ ධර්මයේ විද්‍යමාන මේ තථ්‍ය ස්වරූපී ලක්ෂණය නිසා, ඕනෑම විද්‍යාත්මක යොයාගැනීමක් අබියස බුදුන්වහන්සේගේ දේශනාව ඉදිරියෙන් සිටී.

මානව ශිෂ්ටාචාරය තරමටම මානව සන්නිවේදනය පැරණි ය. මිනිසාට අන්‍යෝන්‍ය වශයෙන් අදහස් හුවමාරු කර ගැනීමට හැකිවූ දා සිටම සන්නිවේදනය පහල විය. සන්නිවේදනයෙන් විග්‍රහ කෙරෙන්නේ ජනතාව සහිත බවකි. එය මිනිසාගේම නිර්මාණයක් වන අතර මිනිසා අතරම පවතී.

මානව සන්නිවේදනය කෙතරම් පැරණි වුවත් ඒ දෙස විද්‍යාත්මක ස්වරූපයෙන් මිනිසා බලන්ට වී තවම වැඩි කලක් ගතවී නැත.

ආරම්භයේදී ජනසන්නිවේදනයේ බෙහෙවින්ම විද්‍යමාන වූයේ ප්‍රාථමික ලක්ෂණය. ගින්න, දුම හා ශබ්දය එදා පැවති ප්‍රධානම පෙළේ සන්නිවේදන මාධ්‍යයන් විය.

මිනිසා අදහස් උදහස් අතින් මෙන්ම කාර්ය ශූරත්වය අතින් ද ක්‍රමයෙන්

දියුණුවී යන්ම ඔවුන් අතර පැවති සන්නිවේදන ක්‍රමයෝද වර්ධනය විය. තාක්ෂණික අතින් විද්‍යාත්මක අතින් ඉතා දියුණු තත්වයක පසුවන නූතන මිනිසාගේ ජීවිතය අද අතිශයින් සංකීර්ණ භාවයකට මුහුණ පා ඇත.

භෞතික ලෝකය ආශ්‍රයෙන් මිනිසා විසින් නිර්මාණය කරනු ලැබූ, විද්‍යා, දර්ශන, ශාස්ත්‍ර, ආගම් හා කලාශිල්පාදියක් සාර්ථක සන්නිවේදනයේ ප්‍රතිඵලයක් ලෙස සන්නිවේදන විද්‍යාඥයෝ පෙන්වා දෙති.

ලෝකයේ පහළවූ ශ්‍රේෂ්ඨතම ශාස්තෘවරයාණන් වූ බුදුරජාණන් වහන්සේ සිය ධර්මදේශනා සේවාව අරඹා ඒ සඳහා සංවිධානාත්මක ප්‍රචාරයක් දියත් කරමින්, පැහැදිලිව ප්‍රකාශ කර සිටියේක් තම දහම් පණිවිඩය සමාජයේ බහුතරය වෙත ගෙනයන අගැයීම් සමූහයක් ලෙසයි. එය කරුණාව හා ප්‍රඥාව ඔස්සේ හදවතට හා බුද්ධියට කෙරෙන සියුම් සන්නිවේදනයකි. මනා එකාග්‍රතාවයකින් යුත් පිරවුල් අදහස් ප්‍රකාශ කිරීමකි. එමගින් පුද්ගලයාගේ ජීවන, චින්තන, හා චර්යාරටා වෙනස් කොට කාලීන අවශ්‍යතා අනුව නව ආකල්ප ගොඩනගන ලදී. සමානාත්මතාව හා විශ්ව සහෝදරත්වය එහි පරමාර්ථ අතර විශිෂ්ඨය.

එක්සත් ජාතීන්ගේ විද්‍යා හා සංස්කෘතික ආයතනය (යුනෙස්කෝව) විසින් 1978 නොවැම්බර් මාසයේදී සාමාජික රාජ්‍ය 146 ක නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් ජනමාධ්‍යයන්ගේ මෙහෙය පිළිබඳ මූලධර්ම ප්‍රකාශනයක් සම්මතකොට ගන්නා ලදී. මේ ප්‍රකාශනය වගන්ති 11 න් සමන්විත ය. එය ආරම්භවන්නේ, සාමයත්, අන්තර්ජාතික අවබෝධයත්, තහවුරු කරණු පිණිස, මානව අයිතිවාසිකම් හුවාලමින් ජාතිභෙදය, වර්ණභෙදය, හා යුද්ධ පෙළඹවීම වලක්වා ලනු පිණිස, ප්‍රවෘත්ති වඩාත් නිදහස් ලෙස ගලායාමත්, ඒවා පෘථුල ලෙස හා වඩා සමබර ලෙස ව්‍යාප්ත වීමත් අවශ්‍යය, යි යන වාක්‍යයෙනි.

මෙහි මුඛ්‍ය ලක්ෂණ වලට අදාලව සිතා බලන විට බුදුන් වහන්සේ ජනසන්නිවේදනය යොදාගෙන ඇත්තේ මිනිසාගේ මානසික සංවර්ධනය සඳහා ය.

නවීන සන්නිවේදන සිද්ධාන්ත වුවද සකස්වී ඇත්තේ විවිධ ගවේෂණ මාර්ග ගණනාවකින් ලද ආභාෂයෙහි ප්‍රතිඵලයක් වශයෙනි.

> " නවීන සන්නිවේදන අධ්‍යයන ක්ෂෙත්‍රය පරීක්ෂා කරන විට නියත වශයෙන් බුද්ධිමතුන්ගේ අනුමැතිය ලද සිද්ධාන්තවලියක් ඇතැයි කිව නොහේ.

එසේත් එබඳු සිද්ධාන්තවලියක් බිහිකිරීමට අවශ්‍ය මූලික චින්තන ප්‍රවාහයන්ගේ ස්වරූපය වටහා ගැනීමට සන්නිවේදන ආකෘති බෙහෙවින් ප්‍රයෝජනවත් වන්නේය." [2]

භාෂණය ලේඛනය හෝ සංඥා මගින් අදහස් දැනුම ඉදිරිපත් කිරීම හෝ හුවමාරු කර ගැනීම සන්නිවේදනයයි, ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයේ දැක්වේ. [3]

අදහස් හා පණිවිඩ සංක්‍රමණය සන්නිවේදනයැයි කොළොම්බියා විශ්වකෝෂය අර්ථ කථනයක් දෙයි. [4] මේ අනුව සන්නිවේදනය වූ කලි එක් පුද්ගලයකු තවත් පුද්ගලයකුට හෝ පිරිසකට හෝ තොරතුරු අදහස් හා ආකල්පයන් විසුරුවා හරින උපක්‍රමයකි. [5]

කවරකු විසින් කුමක්, කුමන මාධ්‍යයකින් කවරකුට කුමක් සඳහා කියනු ලබයිද එය සන්නිවේදනය යැයි හැරල්ඩ් ලැස්වෙල් සන්නිවේදන ක්‍රියාදාමය සම්පිණ්ඩනය කරයි. [6]

ජනසන්නිවේදන විද්‍යාව පිළිබඳ ප්‍රමාණික විශේෂඥයකු වන මහාචාර්ය විල්බර් ශ්‍රැම් තොරතුරු ගැබ්වූ සංඥාවක් කරනකොට ගෙන දෙපක්ෂයක් අතර එක හා සමාන චිත්තතත්වයක් ඇතිකර ලීම සන්නිවේදනයේ මුඛ්‍යතම ලක්ෂණය වශයෙන් දක්වයි. [7] මෙවැනි නිර්වචන සන්නිවේදන යන්නෙහි අර්ථාවබෝධයට මහත් රුකුලක් වී තිබේ. මෙසේ විවිධ අර්ථ නිරූපණයන් හා අර්ථ කථනයන් ඔස්සේ සීඝ්‍ර දියුණුවකට පාත්‍ර වී ඇති සන්නිවේදන විද්‍යාව වර්තමාන මානව සමාජයේ අත්‍යවශ්‍ය අංගයක් බවට පත්ව ඇත. සංස්කෘතික, සාමාජික ආර්ථික, දේශපාලනික විවිධ ක්ෂේත්‍රයන්හි ද පැතිර පවතී. මේ පෘථුල ව්‍යාප්තියත් සමඟ නිවේදනාත්මක සන්නිවේදනය x පහත අනුනයාත්මක සන්නිවේදනය ආදී වශයෙන් සන්නිවේදනය විවිධ ප්‍රභේද රාශියකට බෙදී ගොස් තිබේ. මේ සෑම සන්නිවේදන ක්‍රමයකින්ම මානව වර්ගයා අතරට පණිවුඩ ගෙනයාම සිදුවුවත්, ජන සන්නිවේදනය සන්නිවේදන විද්‍යාවේ එක් අංගයක් පමණකැයි පැවසීමට තරමට අද සන්නිවේදන විද්‍යාව සීඝ්‍ර සංවර්ධනයකට පාත්‍රව ඇත.

ජන සන්නිවේදනය පිළිබඳවද නිර්වචන බොහෝ ය. නවීන ලෝකයේ පුරවැසියන් අතර අදහස් සිතුවිලි හැඟීම් හුවමාරුකර ගැනීමට ඉවහල්වන උපකරණ හා මාධ්‍යයන් ජනසන්නිවේදනය යනුවෙන් ඇතැමිහු හඳුන්වති.

සමකාලීන සමාජයේ පැතිර යන තොරතුරු අදහස් සංකල්පනා යනාදිය ජනසන්නිවේදනය ලෙස සමහරු විග්‍රහ කරති.

x උපදේශාත්මක සන්නිවේදනය, පුද්ගලාන්තර සන්නිවේදනය,
සංකේතාත්මක සන්නිවේදනය,

ජනමාධ්‍ය හා ඒවායේ ක්‍රමානුකූල පැවැත්මට අවශ්‍ය සමාජ ආයතන හා සංවිධාන ජනසන්නිවේදනය බව සමහරුන්ගේ අදහසයි.[8] ආචාර්ය විල්බර් ශ්‍රැම් ජනසන්නිවේදනය වූකලි බොහෝ විට සංවිධානාත්මක පිරිසක් විසින් තවත් පිරිසකට සංදේශයන් ලංකිරීමක් ලෙසද හඳුනාගත හැකි බව පවසයි.[9]

මේ නිර්වචන සියල්ලෙන්ම ප්‍රකාශිත අදහස් ජනසන්නිවේදන විෂය ක්ෂෙත්‍රයට අයත් හෙයින් අපගේ ප්‍රස්තුත පර්යෙෂණයට අදාල පරිදි සන්නිවේදනය වූ කලී අදහස් පලකිරීම හා හුවමාරු කර ගැනීම වන අතර විශාල ජනතාවක් සමග කෙරෙන සන්නිවේදනය ජනසන්නිවේදනයයි යන නිර්වචනය අප මෙහිදී ආශ්‍රය කරගෙන ඇත.[10]

## සටහන්

1. බුද්ධාගම හා ජාති ප්‍රශ්නය. පිට 3. ගුණපාල මලලසේකර හා ජේ.ඇප්.ජයතිලක රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.

2. බලන්ත මානව සන්නිවේදනය. ආචාර්ය විමල් දිසානායක. සීමාසහිත ලේක් හවුස් ඉන්වෙස්ට්මන්ට් සමාගම. පිටුව 58

3. Oxford Dictionary

4. කොළම්බියා විශ්වකෝෂය

5. Emergy. Ault and Agce (Ed) Introduction to Mass Communi- -cation

6. W.Schramm & Donald F Roberts (Ed) The Process & Effects of Mass Communication. Illinois 1971 p. 84

7. - do -

8. බලන්ත මානව සන්නිවේදනය. ආචාර්ය විමල් දිසානායක. සීමාසහිත ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට් සමාගම. ප්‍රථම මුද්‍රණය 1979 පිට 63

9. The Process & Effects of Mass Communication . p.9

10. ආචාර්ය ජේ.බී.දිසානායක. දෙසතිය පුවත් සඟරාව. වෙළුම 3, කලාපය 1 පිටුව 10.

## 1 වැනි පරිච්ඡේදය

### ඉගැන්වීම පිළිබඳ බෞද්ධ සංකල්පය

ජනසන්නිවේදනයත් අධ්‍යාපනයත් අතර ඉතා සමීප සම්බන්ධයකින් පවතී. සන්නිවේදනය පිළිබඳ අවබෝධය පුළුල්වීම අධ්‍යාපනය පිළිබඳ පහසුකම් සුලභවීමයි.

තොරතුරු කියාදීම, සංස්කෘතිය පවරාදීම කරුණු සිතට කාවැද්දීම යන ක්‍රියාවන් ඉගැන්වීම හැටියට ඇතැම් බටහිර අධ්‍යාපනඥයෝ[1] පෙන්වා දෙති. ජනසන්නිවේදන මාධ්‍යයන්ගේ ප්‍රධාන අරමුණු අතරද තොරතුරු සැපයීම, අධ්‍යාපනයක් ලබාදීම, යම් යම් කාර්යයන් සඳහා පොළඹවාගැනීම යන පරමාර්ථ විද්‍යමානය.[1]

තොරතුරු කියාදීම එක්තරා විදියක ඉගැන්වීමක් ලෙස පෙනෙතත්, එය කෙනකුගේ චර්යාත්මක වෙනසක් ඇති කිරීමට තරම් පෙහොසත් වේද ? ඉගැන්වීම හැටියට සමහරුන් පෙන්වා දී ඇත්තේ කරුණු සිතට කාවැද්දීම හා බැහැරින් දැනුම් ඒකක ආනයනය කිරීමය. එමගින්ද පුද්ගලයා තුළ අත්දැකීම් හා චර්යාත්මක අංශයෙන් වෙනසක් සිදු නොවන බව පෙනේ.

අධිශික්ෂණය ඉගැන්වීම වශයෙන් අර්ථ නිරූපනය කර ඇතත් එහි යථා ස්වරූපය තුළ අධ්‍යාපන ක්‍රියාවලියක දක්නට ඇති ප්‍රගතිශීලී සංකල්ප කිසිවක් නැත.

කිසියම් ආගමික මතවාදයක් හෝ දේශපාලන මතවාදයක් ඒ අයුරින්ම පිළිගැනීම සඳහා කෙනකු නිශ්චිත රටාවක් අනුව පුරුදු කිරීම අධිශික්ෂණයෙන් අදහස් කරයි. මෙවැනි ක්‍රියාවලියක් දියත් කරන තැනකදී වුවද පුද්ගලයාගේ විචාරශීලී බව, විමසුම, විවේචනය, වැනි අදහස්වලට ඉඩක් නැත. මනසට කරුණු ආරෝපණය කිරීමද ඉගැන්වීම හැටියට විග්‍රහ කර ඇතත්, ආරෝපණ ක්‍රමය මත යම් විෂයයක් අධ්‍යයනය කරන්නාට ඒ පිළිබඳ පැහැදිලි විචාරපූර්වක දැනීමක් ඇති නොවේ. සිතතුළ අවදිබවක් නොමැතිව, විචාරබවින් තොරව ගුරුවරයාගෙන් ගලායන අදහස් මාලාවක් ක්‍රියාත්මක වීම ඉගැන්වීම නොවන බව මේ අනුව වැටහෙනු ඇත.

බෞද්ධ ගුරුවරයාගේ ඉගැන්වීමේ ක්‍රමය වූයේ කෙළින්ම ශිෂ්‍යයාගේ මනස පුහුණු කිරීමත් , ඔහුගේ චරිතය හැඩගැස්වීමත් ය. ගුරුවරයාගේ අධ්‍යාපන පරමාර්ථය වූයේ පුද්ගලයා තුළ පවත්නා උසස්ම හැකියාවන් හා බලපුළුවන්කාරකම් සම්පූර්ණත්වය හා අවබෝධය ලැබීමට සුදුසු පරිදි පුහුණු කිරීමයි. ආර්ය අෂ්ටාංගික මාර්ගය නමින්

දන්නා ලද්දේ මේ පුහුණුවීමේ ක්‍රමයයි.[2]

" තුම්හෙහි කිච්චං ආතප්පං
අක්ඛාතාරො තථාගතො "[3]

යන බුද්ධ වචනය අනුව, අධ්‍යාපනය සඳහා තමා විසින් උත්සාහකට යුතුය. තථාගතයන් වහන්සේට කළ හැක්කේ මාර්ගය කියාදීම පමණි.

ඉගැන්වීම පිළිබඳ බෞද්ධ මතය දක්නට ලැබෙන සෑම තැනදීම සඳහන්ව ඇත්තේ " උපසමාය, අභිඤ්ඤාය, සම්බොධාය නිබ්බාණාය සංවත්තති "[4] යනුවෙන්ය. මේ නිසා ඉගැන්වීමකින් ශිෂ්‍යයා තුළ ඇතිවිය යුත්තේ පූර්ණ ජීවිතයක් සඳහා ප්‍රයෝජනවත් වන අවබෝධයයි. ශාස්තෘවරයන් වහන්සේ නමක් දෙශනා කරන්නේ ද සිය පිණිවිඩය මගින් ශ්‍රාවකයන්ට අවබෝධයක් ලබාගැනීමට ඉගැන්වීමයි.

පුද්ගලයකු ඉගෙනගන්නේ කෙසේ ද ? සිතන්නේ කෙසේ ද? ප්‍රතික්‍රියා දක්වන්නේ කෙසේ ද ? සෙසු පුද්ගලයන් සමඟ සම්බන්ධතා පවත්වන්නේ කෙසේ ද ? යන ප්‍රශ්න යන්ට අදාලවූ විශාල ඥාන සම්භාරයක් ත්‍රිපිටකාගත සාහිත්‍යයේ ඇත.

බෞද්ධ දෙශනා න්‍යායට අනුව, ගැටළු විශ්ලේෂණය කිරීම හා ඒවා විශ්ලේෂණය කරන ක්‍රම පිළිබඳ අවබෝධය ඉගැන්වීම් ක්‍රමයක මූලික තැන් ගනී. කෙනකු තුළ අවබෝධය ඇතිකරවිය හැකි ඉගැන්වීම් ක්‍රම 4 ක් ඇත.[5]

එකංස ව්‍යාකරණීය
පටිපුච්ඡා ව්‍යාකරණීය
විභජ්ජ ව්‍යාකරණීය හා
ඨපනීය වශයෙන් ය, ඒ.

සමස්තයක් වශයෙන් ගෙන බලන විට මේ ප්‍රශ්න නිරාකරණයෙහි ලා ඒ ඒ ප්‍රශ්නයේ ස්වරූපයට අනුව කරන ලද වර්ගීකරණයකි. බුදුරජාණන් වහන්සේ, ප්‍රශ්නයකට පිළිතුරු දීමට පෙර එය මොන වර්ගයේ ප්‍රශ්නයක්දැයි සලකා බලති. ප්‍රශ්නය අර්ථසම්පන්නද, නිරර්ථකද කියා සොයා බලති. එහිලා විශ්ලේෂණය වැදගත් ය.

දීඝනිකායේ පොට්ඨපාද සූත්‍රයට අනුව,[6] බුදුන් වහන්සේ එකංසික ධර්මයන්ද, එකංසික නොවූ ධර්මයන්ද දෙශනා කර ඇතැයි වදාළහ.

ඒකංසික ධර්මයන් චතුරාර්ය සත්‍යය අනුව දැක්විය හැක. අනෙකංසික

ධර්මයන් උන්වහන්සේ පිළිතුරු නොදී බැහැරකළ ධර්මයන් ලෙස පෙනේ. ඒකාංශ, පටිපුච්ඡා හා විභජ්ජ ව්‍යාකරණීය ප්‍රශ්න අර්ථ සම්පන්නයි. ඨපනීය ප්‍රශ්න, අර්ථ ශූන්‍යයි.

මේ අනුව, බුදුරජාණන්වහන්සේ ප්‍රශ්නයෙහි ස්වරූපය පැහැදිලිව අවබෝධ කරගෙන පිළිතුරු දියයුතු ප්‍රශ්නවලට පමණක් පිළිතුරු දුන් ශාස්තෘවරයෙකු බව පෙනේ,

## සටහන්

1. මානව සන්නිවේදනය. ආචාර්ය විමල් දිසානායක පිට 12
සීමාසහිත ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට් සමාගම 1977

2. බුද්ධකාලීන භාරත සංස්කෘතිය. පිට 114. ආචාර්ය ඒ.පී.ද සොයිසා

3. ධම්මපද මග්ගවග්ග ගාථා 276

4. මහාවග්ගපාලි ප්‍රථමභාගය . පිට 20 . බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා

5. අංගුත්තර නිකාය. චතුක්ක නිපාත. පිට 90
පඤ්හ ව්‍යාකරණසුත්ත . බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා

6. දීඝ නිකාය 1 . පොට්ඨපාද සූත්‍රය. පිට 418
බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා

## 2 වන පරිච්ඡේදය

### බෞද්ධ ඉගැන්වීමේ ක්‍රම විද්‍යාව

බෞද්ධ ඉගැන්වීමේ ක්‍රමය අනුව කෙනකු තුළ අවබෝධය ඇති කිරීමේදී පුද්ගල විවිධත්වය ගැන බෙහෙවින් සැලකිලිමත්වූ බව පැහැදිලි කරයි. මනස සෑහෙන තරම් දියුණු තත්වයකට පත්නොවූ අය සඳහා පාඩමක් ඉදිරිපත් කිරීමේදී පුද්ගලයා තුළ සෑහෙන තරම් ප්‍රබෝධයක් හා පෙළඹවීමක් ජනිතවන අයුරින් කර ඇත. දාන කථා, සීලකථා, සග්ග කථා ආදිවූ අනුපිළිවෙළ කථා ක්‍රමය මේ සඳහා උපයෝගී කරගෙන තිබේ. [1] එය ගැඹුරු දහමක් කෙරේ යාමට පළමුව සිත හොඳ මානසික තත්වයකට ගෙන ඒමයි. කථාක්‍රමය අභාවිත තන්හිදී බුදුරදුන් විසින් ප්‍රශ්න නගා පුද්ගලයා තුළ අම්බෝධය හා ප්‍රබෝධය ඇතිකර පාඩම් උගන්වා ඇත. [2] තවත් තැනකදී කාලානුරූපව, සිදුවීමක් ආශ්‍රයෙන් කථාව ගොඩනගාගෙන පාඩමට පිවිස ඇත. [3] මෙය නූතන ඉගැන්වීමේ ක්‍රම විද්‍යාවේ මූලික පියවරකි. බොහෝ තන්හිදී බුදුන්වහන්සේ පාඩම් උගන්වා ඇත්තේ සංවිධානාත්මක පියවර ක්‍රමයක් මතය. පළමුව විෂය කරුණු ඉදිරිපත් කොට , ඒ කරුණු සිතට අවබෝධ කරවා, ඒවා භාවිතයට පත්කොට, අවසානයේ ප්‍රීති ප්‍රමෝදයට පත්කර පාඩම අවසාන කළ බව පෙනේ. [4]
( භගවා ධම්මියා කථාය සන්දස්සෙති, සමාදපෙති, සමුත්තෙජෙති, සම්පහංසෙති.)

ත්‍රිපිටකාගත බෞද්ධ සාහිත්‍යයට අනුව බුදුන් වහන්සේ පුද්ගලයන්ට කරුණු සිතට අවබෝධ ~~කරවා, ඒවා භාවිතයට පත්කොට, අ~~ කරවීම සඳහා අනුගමනය කළ දේශනා රටාව, බෞද්ධ ඉගැන්වීම් ක්‍රම විද්‍යාවක් ලෙස ද දැක්විය හැක.

1. දේශනා ක්‍රමය
2. ප්‍රශ්න නැගීමේ ක්‍රමය
3. අනාවරණ ක්‍රමය
4. සාමූහික ඉගැන්වීමේ ක්‍රමය
5. ප්‍රහේලිකා ක්‍රමය
6. උපමා භාවිතා කිරීමේ ක්‍රමය
7. පියවර ක්‍රමය
8. නිදර්ශන ක්‍රමය _ පරිසරය ආශ්‍රිත ඉගැන්වීමේ ක්‍රමය
9. පර්යේෂණ ක්‍රමය
10. සාකච්ඡා ක්‍රමය

මේ බෞද්ධ ඉගැන්වීමේ ක්‍රම විද්‍යාවේ අංගයෝය.

1. <u>දෙශනා ක්‍රමය</u> :-

ප්‍රකට දේශනා ක්‍රමවල බොහෝ ඌනතා දක්නට ඇතත්, බුදුන්වහන්සේගේ දේශනා ක්‍රමය පුද්ගලයා තුළ බොහෝ දුරට අවබෝධය තහවුරු කරන ක්‍රමයක් විය.

බුදුන්වහන්සේ නිතරම අලුත් සංකල්පයන් ඉදිරිපත් කිරීමේදී භාවිතා කරන ලද්දේ දේශනා ක්‍රමයයි. දම්සක් පැවතුම් සූත්‍ර දේශනාවේදී ද උන් වහන්සේ අනුගමනය කර ඇත්තේ දේශනා ක්‍රමයයි. දෙශනා ක්‍රමයේදී වුවද අවශ්‍ය තන්හිදී ප්‍රශ්න නගා ශ්‍රාවක යන්ගේ අවධානය යොමු කිරීම සම්ප්‍රදායයි.

මජ්ඣිමනිකායේ ධම්මචෙතිය සූත්‍රයට [5] අනුව පසේනදි කොසොල් රජතුමා දේශනා ක්‍රමය ගැන අතිශයින්ම පැහැදුනු කෙනෙකුන්ව සිටි බව "භාග්‍යවතුන් වහන්සේ ධර්ම කථාවෙන් කරුණු දක්වති. කරුණු ගන්වති. උනන්දු කරවති. සිත පහදවති." යන ප්‍රකාශයෙන් පැහැදිලි වෙයි.

2. <u>ප්‍රශ්න නැගීමේ ක්‍රමය</u> :-

ඉගැන්වීමේ ක්‍රමයක් වශයෙන් ප්‍රශ්න නැගීමේ ක්‍රමය පුද්ගලයා කෙරේ නව පිබිදීමක් ඇති කරයි. ඉගෙනීම යනු ගැටලු නිරාකරණය කරගැනීම නිසා ප්‍රශ්න නැගීමේ ක්‍රමයෙන් ගැටලුව, එහි ස්වභාවය, එය විසඳන ක්‍රමය යන අංග පිළිබඳව ශිෂ්‍යයාගේ අවධානය යොමුකළ හැක. එමගින් දේශනය කෙරේ ශිෂ්‍යයා තුළ ඇතිවිය හැකි අලස බව හා පසුබටතා පහවයයි.

" මහණෙනි, ඒ කිමැයි සිතවු ද ? රූපස්කන්ධය නිත්‍ය ද ? අනිත්‍ය ද?
ස්වාමීනි අනිත්‍යයි.
යමක් අනිත්‍ය වේනම් එය දුක් ද ? සැප ද ?
ස්වාමීනි දුක් ය.
යමක් අනිත්‍ය ද ? දුක් ද ? ~~පෙරළුණ සුව ද ?~~ පෙරළෙන සුළුද ?
එබඳු දෙය මාගේ ය. මේ තෙමේ මම වෙමි.
මේ තෙමේ මගේ ආත්මයැයි දක්නට සුදුසු ද ?
ස්වාමීනි, ඒ නුසුදුසු ය. "

( තං කිමඤ්ඤථ භික්ඛවේ රූපං නිච්චංවා අනිච්චංවාති අනිච්චං භන්තෙ ) [6]

ත්‍රිපිටකාගත සූත්‍ර විග්‍රහකර බැලීමේදී ප්‍රශ්න නැගීමේ ක්‍රමය බහුලව දක්නට ලැබේ. මහා නිද්දේස පාළියේ [7] ප්‍රශ්න වර්ග 3 ක් දක්වා ඇත.

1. අදිට්ඨ ජෝතනා පුච්ඡා
2. දිට්ඨ සංසන්දනා පුච්ඡා
3. විමතිච්ඡේදන පුච්ඡා යනුවෙන් ය.

පළමුවැනි ප්‍රශ්න වර්ගය තමා දන්නා දේ තව තවත් ගැඹුරු කරන ප්‍රශ්න නැගීමයි. ධර්මයාගේ ලක්ෂණය දැනීමට, තුලනයට, ප්‍රකට කිරීමට ප්‍රශ්න විචාරීමයි. දෙවැනි ප්‍රශ්න වර්ගය අපැහැදිලි තැන් පැහැදිලි කිරීමට නගන ප්‍රශ්නයි. තුලනය කරන ලද්දක් අන්‍ය පණ්ඩිතයන් හා සසඳාලීම පිණිස ප්‍රශ්න විචාරීමයි.

තුන්වන වර්ගය නම් සැකය පහකිරීමට නගන ප්‍රශ්නයි. තවත් ප්‍රශ්න ගණනාවක් ගැන එහිම 468 පිටුවෙහි එයි. ප්‍රශ්නයක් නැගීමෙන් කෙනකු තුළ ගැඹුරු අවබෝධයක් ඇති වන්නේ ය.

3. <u>අනාවරණ ක්‍රමය :-</u>

නූතන මනෝවිද්‍යාඥයන්ගේ විශේෂ අවධානයට හා ප්‍රශංසාවට භාජනයවී ඇති අනාවරණ ඉගෙනීමේ ක්‍රමය මුලින්ම ලොවට හෙළි කිරීමේ ගෞරවය බුදුන්වහන්සේට අයත්වේ.

පුතු මළ සොවින් තැවුණු කිසාගෝතමියට ජීවිතයේ අනිත්‍යතාව ඉගැන්නුවේ අනාවරණයෙන් ඉගෙනුම ලැබීමේ ක්‍රමයටය. මේ සඳහා බුදුන්වහන්සේ විසින් ඇයට කිසිවකු නොමළ ගෙයකින් අබඇට ස්වල්පයක් ගෙන ඒමට යොමුකර තිබේ.

බුදුරජාණන්වහන්සේ යෙදූ උපක්‍රමය මත කිසිවකු නොමළ ගෙයක් නැති බවත් ඒ නිසාම ජීවිතය අනියත බවත් වැටහී ඇය තුළ නව දර්ශනයක් පහලවිය.

ථෙරී ගාථා පාළියේ සඳහන් පටාචාරා [9] ථෙරියගේ පුවත අනුවද පටාචාරාගේ පා දෙවූ ජලය මහපොළොවේ ගලාගොස් සිඳී යන ආකාරය දැක රහත්වූ බව සඳහන්වෙයි.

බුද්ධෝපදේශ අනුව ශාසනයේ පැවිදිවූ බොහෝ ශ්‍රාවක ශ්‍රාවිකාවෝ අර්හත්ඵලයට පත්වූවාහු යම් යම් අරමුණු දැක අනාවරණය කරගන්නා ලද අවබෝධය මතය. ඉගැන්විය යුතු දේ ඉගැන්විය යුතු ආකාරය හා ප්‍රමාණය ආදිය නිගමනය

කිරීම සඳහා ඔවුන්ගේම චාරියාරටා හාවිතා කිරීම උචිත කරුණක් වනු ඇත.

4. සාමූහික ඉගැන්වීමේ ක්‍රමය :-

සමූහ ඉගැන්වීමේ ක්‍රමය හෙවත් කාණ්ඩ ඉගැන්වීමේ ක්‍රමය බුදුන්වහන්සේ ගේ තවත් ඉගැන්වීමේ ක්‍රමයකි. දම්සභා මණ්ඩපය කාණ්ඩ ඉගැන්වීමේ ක්‍රමය ක්‍රියාත්මක කළ හොඳම ස්ථානයකි.

බුදුන් වහන්සේ පුද්ගල විවිධතාව අනුව දහම් දෙශනාකළත්, දේශනාවන්ගෙන් වැඩි ප්‍රමාණයක් කාණ්ඩ ක්‍රමයට සිවුවනක් පිරිස සඳහාම ඉදිරිපත් කර ඇත. මූලික දෙශනාව පවත්වා පසුව එයට දක්වන ප්‍රතිචාරය අනුව පෞද්ගලික ඉගැන්වීම ඔපවත් කළහුයි අයුරු පඤ්චවග්ගිය භික්ෂූන්ගේ ප්‍රව්‍රජ්‍යාව සම්බන්ධව කතා පුවතින් පෙනී යයි.[10]

5. ප්‍රහේලිකා ක්‍රමය :-

මනසේ එකාකාරී ස්වභාවය සිඳ බිඳ එහි අවදිබවක් ඇති කිරීමේ[11] මේ ඉගැන්වීමේ ක්‍රමය මගින් සිදුකෙරේ. වම්මික සූත්‍ර දෙශනාවේදි රහතන් වහන්සේ පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීමේදී බුදුරජානන්වහන්සේ විසින් අනුගමනය කර ඇත්තේ මේ ක්‍රමයයි.

රාත්‍රි කාලයට දුම් දමන, දාවල් කාලයේ බබලන අරුම පුදුම තුඹසක් අරමුනු කරගෙන කතාව හා ගැටලුව ඉදිරිපත් කර ඇත. මේ තුඹස ආයුධයක් ගෙන හැරීමේදී මැරී හිල්වූ මැඩියකු හමුවෙයි. එය තව දුරටත් හාරන කල්හි මාර්ග දෙකක් හමුවේ. අවසන් වශයෙන් නාගයකු හමුවීම දක්වා තුඹස හැරිය යුතු බව එහි දක්වේ. මේ වැනි දෙශනයක් ශ්‍රවනය කරන්නා තුඹස කෙබඳු තත්වයේ එකක්ද යන්න පිළිබඳ හාරා අවුස්සා බැලීමට පෙළඹෙනු ඇත.

පෙෂකාරී දියනියගේ කතාව ද[12] ප්‍රහේලිකා ස්වරූපයෙන් ඉදිරිපත් කර ඇත. ධම්මපදයේ පහත සඳහන් ගාථා[13] ප්‍රහේලිකා ස්වරූපයක් ගනී.

මාතරං පිතරං හන්ත්වා
රාජානො දෙවච ඛත්තියෙ
රට්ඨං සානු චරං හන්ත්වා
අනීඝොයාති බ්‍රාහ්මණො

ධම්මපද පකිණ්ණක වග්ග, ගාථා 294

මාතරං පිතරං හන්ත්වා,